කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2022

------------------------------------------------------------------------------------------------------------

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2021 ජූනි 10 දින එළඹි අංක 2000003227 දරන ණය ගිවිසුම හා අංක 2000003226 අරමුදල් ගිවිසුමේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ SARP සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ව්‍යාපෘති ප්‍රදේශයේ ග්‍රාමීය කුඩා වතු නිවාස 40,000 ක අහිතකර බලපෑම අවම කිරීමේ හැකියාව සහ වෙළඳපොල සහභාගීත්වය ගොඩනැගීම ව්‍යාපෘතියේ අරමුණු වේ. දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් අගය දාම සඳහා ධාරිතා ගොඩනැගීම, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඇතුළත් අගය දාම සඳහා ආයෝජනය සහ ව්‍යාපෘති කළමනාකරණය සහ සම්බන්ධීකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,954 කට සමාන වූ එජඩො මිලියන 55.3 වන අතර ඉන් රු. මිලියන 7,686 කට සමාන වූ එජඩො මිලියන 42.7 ක් සැපයීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 2,268 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2021 ජූනි 10 දින ආරම්භ කරන ලද අතර, 2027 ජූනි 10 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වාසි ක්වික් කැබ් වෙතින් වාහන කුලියට ගැනීමට ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 01 දින ගිවිසුමකට එළැඹ ඇති අතර ඒ අනුව 2022 දෙසැම්බර් වන විට ගෙවිය යුතු කුලී ගාස්තුව උපචිත කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2.2 | එකඟයි, එය ඊළඟ වසරේ සිට නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව ගිණුම් තබා ගත යුතුය. |
| (ආ) | ලෙජරයේ සඳහන් බොහෝ වවුචර් අංක මුද්‍රිත වවුචර්වල සඳහන් අංක සමඟ නොගැලපෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. | - | එකඟයි, මෙය ගිණුම්කරණ මෘදුකාංගයේ ආයතනයට අවශ්‍ය පරිදි සකස් කිරීම (customization) නිසා වන අතර එය නිවැරදි කර යාවත්කාලීන කර ඇත. | වවුචර් සකස් කිරීමේදී අංක ගණිත නිරවද්‍යතාවය ගැන සැලකිලිමත් විය යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 පෙබරවාරි 07 දිනැති 1/2022 කළමනාකරණ විගණන චක්‍රලේඛය | වසරකට වැඩි ව්‍යාපෘති කාලසීමාවක් සහ එජඩො මිලියන 05කට වැඩි මුළු පිරිවැයක් සහිත ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවද, මේ දක්වා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැති බව නිරීක්ෂණය විය. | කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සහෝදර ව්‍යාපෘතියක් වන බැවින් IFAD හි අනුමැතිය ඇතිව කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ අභ්‍යන්තර විගණකවරයාගේ සේවය ලබා ගැනීමේ හැකියාව ප්‍රථමයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අපේක්ෂා කරයි. කෙසේ වෙතත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන රැස්වීමේ දී ලබා දී ඇති උපදෙස් අනුව, අභ්‍යන්තර විගණකවරයෙකු සඳහා අනුමැතිය ලබා ගැනීමට අපි නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව(MSD)වෙතින් ඉල්ලා සිටිමු. | කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව සුදුසුකම් ලත් අභ්‍යන්තර විගණකවරයකු පත් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| රු.මිලියන 5ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංගයක් ස්ථාපනය කිරීම සඳහා සොෆ්ට් විෂන් ටෙක්නොලොජීස් (පුද්) සමාගම වෙත 2022 ඔක්තෝබර් 10 වැනි දින මිලදී ගැනීමේ ඇණවුමක් නිකුත් කර තිබුණි. මිලදී ගැනීමේ ඇණවුමෙහි නිශ්චිත නියමයන්ට අනුව, මෘදුකාංගය ස්ථාපනය කිරීමට අදාළ සියලුම ක්‍රියාකාරකම් 2022 ඔක්තෝබර් 10 සිට දින 26ක් ඇතුළත අවසන් කර තිබිය යුතුය. කෙසේ වෙතත්, ස්ථාපන ක්‍රියාවලිය 2023 ජූනි 27 වන විටත් අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | එකඟයි, මෙය ගිණුම්කරණ මෘදුකාංගයේ ආයතනයට අවශ්‍ය පරිදි සකස් කිරීම (customization) තවමත් සිදුවෙමින් පවතින අතර ගිවිසුම්ගත මුදලින් සියයට 75 ක් අද වන විට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ගෙවා ඇත. | ගිණුම්කරණ මෘදුකාංග ඉක්මනින් ස්ථාපනය කළ යුතුය. |

## 3.2 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 04 වන දින නිකුත් කරන ලද ව්‍යාපෘති සැලසුම් වාර්තාවට අනුව, ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇතත්, කෙසේ වෙතත් මුල්‍ය ගිවිසුම 2021 ජුනි 10 වන දින අත්සන් කර තිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ කාලසීමාව වසර 06 කි. කෙසේ වෙතත්, 2022 අගෝස්තු මාසයේ සිට ව්‍යාපෘතිය මුල්‍ය හා මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, මුල්‍ය ගිවිසුමෙන් පසු වසරකට වැඩි කාලයක් ව්‍යාපෘතිය අක්‍රියව පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මුල්‍ය ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි යටතේ උපලේඛන I හි 7.2 ඡේදය සහ VII වගන්තියේ 7.13 ඡේදය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ දිස්ත්‍රික් කාර්යාල යන දෙකටම ප්‍රධාන ව්‍යාපෘති සඳහා පිරිස බඳවා ගැනීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, වරින් වර කරන ලද ඉල්ලීම් සහ සිහි කැඳවීම් නොසලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින තනතුරු ප්‍රමාණය සඳහා අනුමැතිය ලබා දීමට වැඩි කාලයක් ගත විය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කාල රාමුව තුළ විය යුතුය. |